# බස්නාහිර පළාත
# மேல் மாகாணம்
# Western Province

**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත**

**மாகாண வீதி, போக்குவரத்து, கூட்டுறவு அபிவிருத்தி மற்றும் வாணிபம்,வீடுமற்றும் நிர்மாணத்துறை, தோட்ட உட்கட்டமைப்பு வசதிகள், கைத்தொழில் மற்றும் கிராமிய அபிவிருத்தி தொடர்பான அமைச்சு - மேல் மாகாணம்**

**Ministry of Provincial Roads, Transport, Co-operative Development and Trade, Housing and Constructions, Estate Infrastructure Facilities, Industry and Rural Development - Western Province**


ලේකම් 011 2092739
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
Mawatha,
Battaramulla

செயலாளர் 011 2092739
இல. 204,
டென்சில் கொப்பேகடுவ □□□□□□□
බත්තරමුල්ල.

Secretary 011 2092739
No. 204,
Denzil Kobbekaduwa
பத்தரமுல்ல.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | WP/MPR/ADM/13/2/1<br>(II වෙළුම) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | ..................... | දිනය<br>திகதி<br>Date | 2023.10. |

ප්‍රධාන ලේකම් (බ.ප)
ආණ්ඩුකාර ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)
සභා ලේකම් (බ.ප),
සියලුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප),

කර්මාන්ත දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
06 OCT 2023
බස්නාහිර සළාත් සභා ගොඩනැගිල්ල
බත්තරමුල්ල.

<u>පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>

මෙම අමාත්‍යාංශය යටතේ පවතින බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ උපදේශක තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය මේ සමඟ එවන අතර එය ඔබගේ ආයතනයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

කේ. චම්පා එන්. පෙරේරා,
ලේකම්,
පළාත් මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

<u>පිටපත්:</u>
01. පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ, කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප.) - කරු.අ.ක.ස. හා ඔබගේ වෙබ් අඩවියේ පළ කිරීම සඳහා
02. I/T8 විෂයභාර නිලධාරී - අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ පළ කිරීම සඳහා

පළාත් මාර්ග හා කර්මාන්ත අමාත්‍යාංශය
බස්නාහිර පළාත.
2023/10/05

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2023 ( සීමිත)**

**01.** බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ පහත තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.1.** **පරිගණක උපදේශක - 01**
**1.2.** **මැණික් උපදේශක - 01**
**1.3.** **කාර්මික උපදේශක - 02**

**02.** පුරප්පාඩු සංඛ්‍යාව: **04**

**03.** අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2023/10/25**

**04.** <u>පොදු කොන්දේසි</u>

4.1. අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

4.2. **2019.02.28** දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

4.3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි ( දැනට රාජ්‍ය සේවයේ සිටින්නන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ)

4.4. මනා චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

**05.** සේවා කොන්දේසි

බඳවා ගන්නා නිලධාරීන් බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, ප්‍රමානවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

**06.** මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච. 03/2016 අනුව,

රු.27,140 -10x300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - 45,540/- (වැටුප් කාණ්ඩය - MN -1)

**07.** අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

7.1. <u>අධ්‍යාපන සුදුසුකම්</u>

(අ) අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ ඇතුළුව විෂයයන් 03කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත් වීම (එකවරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් වත් සමත් වී තිබිය යුතුය.)

7.2. <u>වෘත්තීය සුදුසුකම්</u>

ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයක පහත සඳහන් පුහුණු පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම

| අනු අංකය | තනතුර | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| 01. | පරිගණක උපදේශක | ➢ රජයේ ආයතනයක් විසින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් පෞද්ගලික ආයතනයක් විසින් පවත්වනු ලබන, එක් අවුරුදු හෝ ඊට වැඩි පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබීම<br>හෝ<br>➢ බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පරිගණක පුහුණු පාඨමාලාව හදාරා සහතික පත්‍රය ලබා තිබීම.<br>➢ පරිගණක උපදේශක තනතුර සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක පරිගණක උපදේශක උපදේශක වශයෙන් වසර 02 කට නොඅඩු කාලයක් සේවය කර තිබිය යුතුය. |
| 02. | මැණික් කර්මාන්ත උපදේශක | ➢ රජයේ ආයතනයක් විසින් හෝ වෘතීය පුහුණු අධිකාරිය විසින් පවත්වනු ලබන එක් අවරුදු හෝ ඊට වැඩි මැණික් හා ආභරණ පිළිබඳ පාඨමාලාවක් හදාරා අවසන් සහතික පත්‍රය ලබා තිබීම<br>හෝ<br>➢ රාජ්‍ය මැණික් සංස්ථාව හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් රත්න විද්‍යාව පිළිබඳව ලබා ගත් එක් අවුරුදු පාඨමාලා සහතිකය ( CERTIFICATE IN GEMLOGY, CERTIFICATE IN LAPIDARY)<br>හෝ<br>➢ බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මැණික් කර්මාන්ත පුහුණු පාඨමාලාව හදාරා සහතික පත්‍රය ලබා තිබීම. |
| 03. | කාර්මික උපදේශක | ➢ රජයේ ආයතනයක් විසින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විසින් පවත්වනු ලබන (TVEC) යාන්ත්‍රීකරණය පිළිබධව වසරකට හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසන් සහතිකය ලබා තිබීම.<br><u>සටහන</u><br>ජාතික වෘත්තීය සුදුසුකම් ( NVQ) සහතික 4 වන මට්ටම ( NVQ 4 ) හෝ ඉහල සුදුසුකම් ලබා තිබීම අවශ්‍ය වේ. |

7.3 වෙනත්

දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු, ප්‍රාථමික ශ්‍රේණියට අයත් තනතුරෙහි ස්ථිර කරනු ලැබූ අයෙකු විය යුතුය.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පතෙහි සඳහන් කරනු ලබන දිනට සෑම අපේක්ෂකයෙකුම එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් **2023/10/25** දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**08.** බඳවා ගැනීමේ ක්‍රමය

- වෘත්තීය පරීක්ෂණය

අයදුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාල දැනුම, නිර්මාණාත්මක කුසලතාවය හා නිපුණතාවය පරීක්ෂා කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකි. (අවම සමත් ලකුණු 40% )

- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

**09.** අයදුම්කරුවන් තම අයදුම්පත මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත අනුව, ඒ-4 ප්‍රමාණයේ (සෙ.මී.21X29) කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

**10.** සියළුම අයදුම්කරවන් තම අයදුම්පත් **2023/10/25** දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් අදාල අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

**11.** අයදුම්කරුවන් අදාළ නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුලත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

කේ. චම්පා එන්. පෙරේරා,
ලේකම්,
පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ,
නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත
සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

## ආදර්ශ අයදුම්පත

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම - 2023 ( සීමිත)**

අංකය [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

[ ]

අයදුම්කරන තනතුර

**01.** I. මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..................................................................

II. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : ..................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

III. සම්පූර්ණ නම (සිංහලෙන්) : ..................................................................

..................................................................

IV. සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) : ..................................................................

..................................................................

V. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**02.** I. ස්ථිර ලිපිනය (සිංහලෙන්) : ..................................................................

..................................................................

II. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසියෙන්) : ..................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..................................................................

III.ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (අදාල කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2023/10/25** දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය

අවු: .......................... මාස: .......................... දින: ..........................

V. දුරකථන අංකය:

පෞද්ගලික: ......................................... රාජකාරි: ....................................

**03.** ස්ත්‍රී/ පුරුෂ භාවය - (අදාල කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

**04.** I. උපන් දිනය

වර්ෂය: ....................... මාසය: ....................... දිනය: .......................

II. **2023/10/25** දිනට වයස

අවු: ....................... මාස: ....................... දින: .......................

**05.** විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාල කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

**06.** අධ්‍යාපන සුදුසුකම්: (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 07 අනුව)

6.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය

වර්ෂය: ............. විභාග අංකය: ........................... වර්ෂය: ............. විභාග අංකය: ...........................

| අනු අංකය | විෂය | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|
| **01.** | | |
| **02.** | | |
| **03.** | | |
| **04.** | | |
| **05.** | | |
| **06.** | | |
| **07.** | | |
| **08.** | | |

| අනු අංකය | විෂය | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|
| **01.** | | |
| **02.** | | |
| **03.** | | |
| **04.** | | |
| **05.** | | |
| **06.** | | |
| **07.** | | |
| **08.** | | |

6.2. නිවේදනයේ 07 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල වෘත්තීය හා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම්:

6.2.1. පුහුණු පාඨමාලාවේ නම : ..........................................................................................

පුහුණු කාල සීමාව : .............................................. සිට ..................................

ආයතනය : ..........................................................................................

සහතිකය වලංගු වන දිනය : ..........................................................................................

6.2.2. පළපුරුද්ද පිළිබඳ විස්තර:

**07.** පළපුරුද්ද :

| ආයතනයේ නම | කාල සීමාව |
|---|---|
| | |
| | |
| | |

**08.** සේවා විස්තර :

I. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුර හා එම තනතුරට පත්වූ දිනය :

...................

II. සේවය ස්ථිර කරන ලද දිනය : .................

III. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය : ..................

**09.** ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.

**10.** ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවය අවසන් කරනු ලැබීමට යටත්වන බව ද දනිමි.

දිනය : ................

.................................
අයදුම්කරුගේ අත්සන

**11.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

..................................................................................මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ............................................ වශයෙන් .................................. දින සිට සේවය කරන බවත්, තනතුර ස්ථිර කර ඇති බවත්, සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සඳහා නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ඔහු/ ඇය සුදුසුකම් සපුරා ඇති බැවින්, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය : ....................

....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)